

## ලියා දන්වන වග යි

## සුබ අලුත් අවුරුද්දක් වේවා

සන්නස ඇරඹුණේ මෙවැනි බක් මාසයකය. එම නිසා අවුරුදු කාලය සන්නසේ අපට වඩාත් වැදගත් වෙයි. සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට අනාදිමත් කාලයක සිට මාරු වන මේ කාලය පදනම් කොට ගොඩ නැගෙන මේ අපූරු සංස්කෘතික කාල පරාසය වසර දහස් ගණනක් තිස්සේ සැමරෙන්නක්.

ජාතියක අනන්‍යතාව විදහා දැක්වෙන මේ උත්සවය හා බැඳුණු සිරිත් විරිත් චාරිත්‍ර වාරිත්‍ර ජන සමාජයේ ප්‍රගමණයට හේතු වූවා කීවොත් නිවැරදිය. එහෙත් ලෝකය දැන් බොහෝ වෙනස් ය. කාලාන්තරයක් තිස්සේ යුගයෙන් යුගයට සිදුවුණ මේ වෙනස පරිසරයට සමාජයට හා සත්වයනයට කළ බලපෑම අසීමිතය. වැඩවසම් යුගයේ සිට වර්තමානයේ අද දක්වා සිදුවුණ මේ වෙනස ජන සමාජයට විශේෂයෙන් එහි අන්තර්මානව සම්බන්ධතාවනට කළ හානිය බරපතලය. සරලව කිවහොත් අවුරුද්දට අපට හුරු පුරුදු බුලත් අතක් දී ආචාර කොට තරහ මරහ අමතක කොට යාලු මිත්‍රකම් පටන් ගැනීමේ යුගය දැන් අතීතියට එක්වී හමාරය. ආර්ථික අසමානතාවන් හරහා ගොඩ නැගුණ මේ පාරිභෝගික සමාජයක් තුළ මානව ආචාර ධර්ම වලට ඇති ඉඩ කඩ සීමා සහිතය.

අද වන විට මිනිසා පාලනය කරනු ලබන්නේ මාධ්‍ය විසිනි. ඉඳිකට්ටේ සිට යන්ත්‍ර සූත්‍ර දක්වා මුලුතැන් ගෙයි සිට කන්තෝරුව දක්වා දිවෙන මිනිස් චර්යාවන් ගොඩ නගා ගන්නට ද වී ඇත්තේ මාද්‍ය හරහා දෙන උපදෙස් අනුවය. එබැවින් අපේ ජන සමාජයේ ප්‍රධානම සංස්කෘතික උත්සවය වන අලුත් අවුරුදු උත්සවයටද එහි බලපෑමෙන් මිදෙන්නට හැකි වී නැත.

සත්‍යය නම් වත්මන් ලෝකයේ බොහෝ දේ සාරධර්මද ඇතුළුව වානිජකරණයට අසු වී හමාර බවය. අපේ රුචිකත්වය කොබඳු වුවත් අපට ජීවත්වීමට සිදුවී ඇත්තේ එබඳු ලෝකයකය. එහෙත් මේ සියලු සීමාවන් යටතේ වුවද අපට අලුතින් සිතා යමක් කරන්නට ඇති ඉඩ කඩ සම්පූර්ණයෙන්ම නැතිවී ඇති බවක් කිව නොහැකිය.

## ලෝක කුසලානයෙන් පසුව

තවත් ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියක් අවසන් විය. ශ්‍රී ලංකා කණ්ඩායම තවත් වතාවත් කුසලානය අබියසටම ගොස් අනු ශූරතාවකින් සෑහීමකට පත් වී මව් බිම බලා ගියේ ක්‍රිකට් ලෝලීන්ගේ සිත් තුළ ප්‍රශ්න රැසක් ඉතිරි කරමින් ය.

ශ්‍රී ලංකාවට ගිය සැණින් සංගක්කාරගේ  මහේලගේ සහ අරවින්ද ඇතුළු තේරීම් කමිටුවේ ඉල්ලා අස්වීම් පෙන්නුම් කරන්නේ මතුපිටට නොපෙනෙන අභ්‍යන්තර කතාවක් ඇති බව ය.

මේ සියල්ලට හේතුව ක්‍රීඩාව දේශපාලනයට යට වීමද නැත්නම් වෙනත් හේතු කාරණා ද යන්න ඉදිරියේදී හෙළිදරව් වන බව නම් නිසැක ය.

**සංස්කාරක**

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .



# සංචාරක සංවර්ධනය

පිටේ බුදුරුවක් සහිත ටී ෂර්ට් එකක් ඇඳගත් යුක්‍රේන් ජාතික තරුණියක ගැන පුවතක් ගාල්ල පැත්තෙන් වාර්තා වූයේ මෑතක ය. මා ඒ පුවත කියවූයේ ආසාවෙනි. මා අගය කළේ ඇය හමුවී ඇයට කරුණු පැහැදිලි කර දුන් පුංචි හාමුදුරුවන්ගේ ක්‍රියා කලාපයයි. තරුණියට එරෙහිව කොලු ගැටයන් උසිගන්වා කලබලයක් කරන්නට නොසිතූ උන් වහන්සේ ඉතා කාරුණිකව කතා කොට ඇයට කරුණු පහදා දුන්හ. පන්සලට කැඳවා ගොස් ඇයට කුඩා බුදු රුවක් ද ප්‍රදානය කළ හ. ඒ ඇය බුදුන් කෙරෙහි ළැදියාවක් දක්වන්නියක වූ නිසා ය.

ඒ තරුණිය අර විදියට බුදු රුව සහිත ඇඳුමක් ඇගලා ගත්තේ එයින් වන නිගරුව නොතේරුණ හින්දා ය. අර පුංචි හාමුදුරුවන් ඉටු කළේ ඒ වාගේ කරුණු විදේශික සංචාරකයන-'ට කියා දීම භාරවී සිටින වගකිව යුත්තන් විසින් පැහැර හරින ලද රාජකාරියකි.

මෙයින් ඉස්මතු වූයේ සංවර්ධනය උදෙසා සංචාරක කර්මාන්තය නංවා ලන්නට ක්‍රියා කරන රටක වගකිවයුත්තන් විසින් සංවිධානාත්මකව ඉටු කළ යුතුව තිබුණු වැදගත් කාර්යයක් අතපසු ව ඇති බව ය. ඒ රටට එන සංචාරකයන්ට රටේ සංස්කෘතිය හා ආගම් පිළිබඳව අවශ්‍යයෙන්ම දත යුතු කරුණු කියා දී ඔවුන් දැනුවත් කිරීම ය. අර තරුණිය කියා ඇත්තේ ඒ නිසා ඇතිවූ නොදන්නා කමය. අනුරාධපුර නොහොත් පොළොන්නරුවේ නටබුන් වූ බුදු රූ අතර අඩ නිරුවතින් රැඟුම් පාන්නට ගිය සුදු කාන්තාවක ගැන කතාවක් පළ වූයේ කලකට උඩදී ය. දඹුල්ලේ බුදු රුවක් මත වාඩි වී ඡායාරූප ගන්නට ගිය සුදු කතක ගැන කියැවුණේ ඊටත් කලින් ය. ඇය කොළඹ රාජකාරි කළ විදේශිකයකුගේ බිරිය වීම ඊටත් වඩා බරපතළ කරුණකි.

ශ්‍රී ලංකාවට එන සංචාරකයන් වයිවාරන්න අරමුණු සහිතව පැමිණීම අපේක්ෂා කළ යුත්තකි. ඒ අතරම සීමිත පිරිසක් වුවත් දිවයිනේ ඓතිහාසික ශ්‍රී විභූතියත් රටේ පවත්නා සංස්කෘතියත් අවබෝධ කරගෙන අගය කිරීමට සැරසී එන බවද කිව යුතු ය. ඒ අතුරින් කොටසක් පිරිසිදු බුදු දහම පවතින රටක ආගමික වතාවත් හා ඇවතුම් පැවතුම් හදාරන්නට ද එනවා විය හැකිය.

ඒ කිසිවකු තමාගේ සංචාරය කා බී විනෝද වීමට හෝ විවේක සුව විඳීමට සීමා නොකරනු ඇත. දිවයිනේ ජනතාව හා ඔවුන්ගේ සිරිත් විරිත් නැටුම් ගැයුම් ජන ජීවිතයේ විසිතුරු ආදී විවිධ අංශ කෙරෙහි අවධානය යොමු කරන උගත් සංචාරකයන් සිටිනු නිසැකය. එබන්දක් අපේක්ෂා කරන මූලික දැනුම හා විස්තර සාමාන්‍ය විස්තර පත්‍රිකාවකින් දිය නොහැකිය. ඒවාගේ විශේෂ සංචාරක පිරිස් අරමුණු කරගෙන සම්පාදනය කරන ලද පොත පත හා ප්‍රකාශන කෙරෙහි රජයේ අදාළ ආයතන විසින් අවධානය යොමු කළ යුතු ය. ඒවා බෙදාහැරීමේ මධ්‍යස්ථාන මගින් සැලකිය යුතු




ආදායමක් ද ලද හැකි වනු ඇත.

එබඳු අලෙවි මධ්‍යස්ථානවල අවශ්‍යයෙන්ම තිබිය යුතු භාණ්ඩ වර්ගයක් පිළිබඳ ඉඟියක් ඉස්සර කැළණි පන්සල වඳින්නට යන සැදැහැවතුන් පන්සල ළඟ කඩයකින් මිලට ගන්නට පුරුදුව සිටි මැටි භාණ්ඩ ඔස්සේ ලැබෙන්නේ ය. කැළණියේ ටයර් සංස්ථාවේ ප්‍රථම සභාපති වූ චාල්ස් අබයසේකර විසින් සංස්ථා ලාංඡනය සඳහා තෝරා ගනු ලැබුවේ ඒවාගේ කඩවල විකිණූ මැටි සිංහ රූපයකි.

දිවයිනේ ඓතිහාසික මධ්‍යස්ථාන වල දක්නට ඇති සුවිශේෂ

41 වන පිටට

**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**සේයා රූ / Photography**
ප්‍රසන්න කුරුකුලරත්න Prasanna Kurukularatna

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318